පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / Po.Box No — 10120
ෆැක්ස් / Fax — 011-2171635
දුරකථන / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / Web Site — www.Police.lk
ඊ මේල් / E-mail — dir.media@police.gov.lk

මගේ අංකය / My NO — 833/ 2024
ඔබේ අංකය / Your No — / 2024
දිනය / Date — 17/05/2024
පැය 1445

# මාධ්‍ය නිවේදනය

**මත් ද්‍රව්‍ය විනාශ කිරීම සඳහා පුත්තලම වනාතවිල්ලුව ප්‍රදේශයේ අධිබලැති උඳුනක් ස්ථාපිත කිරීම - පොලිස් මූලස්ථානය.**

ශ්‍රී ලංකාව තුළ බාල මහළු, කාන්තා , පිරිමි බේදයකින් තොරව සියල්ලන්ගේම අනාගතය අගාධයට ඇද දමමින් පැතිරයන මත්ද්‍රව්‍ය ජාවාරම තුරන් කිරීම රටේ කාලීන අවශ්‍යතාවයක් වී හමාරය. එකී අවශ්‍යතා සඵල කරමින් විෂ මත්ද්‍රව්‍ය වලින් තොර සමාජයක් බිහිකිරීමේ අරමුණෙන් ශ්‍රී ලංකාවේ සියලුම පොලිස් ස්ථාන, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය හා පොලිස් විශේෂ කාර්ය බලකාය සහ ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් මත්ද්‍රව්‍ය වැටලීම් පුළුල් කිරීමට කටයුතු කිරීමත් සමඟ විශාල වශයෙන් මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීමේ හැකියාව ලැබුණි.

පසුගිය කාල සීමාව තුළ මෙසේ අත්අඩංගුවට ගන්නා ලද මත්ද්‍රව්‍ය තොග විනාශ කිරීම සඳහා රජයට විශාල මුදලක් වැය කිරීමට සිදුවූ අතර, මත්ද්‍රව්‍ය විනාශ කිරීමට ස්ථිර ස්ථානයක් නොමැති වීමෙන් අපහසුතා රාශියක් පැන නැගිණි. මේ සඳහා ස්ථිරසාර විසඳුමක් ලෙස ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායට අයත් පුත්තලම වනාතවිල්ලුව ප්‍රදේශයේ පිහිටි ලැක්ටෝස් වත්ත ඉඩමෙහි පර්චස් 20ක භූමියක් ආවරණය වන පරිදි, මත්ද්‍රව්‍ය විනාශ කිරීම සඳහා අලුතින් අධිබලැති උඳුනක් ශ්‍රී ලංකා පොලිසිය විසින් ස්ථාපිත කරන ලදි.

මෙම මත්ද්‍රව්‍ය විනාශ කිරීම සඳහා වැය වන විශාල මුදල් ප්‍රමාණය අවම කර ගැනීම සහ මෙරටින් මත්ද්‍රව්‍ය මුළු මනින්ම තුරන් කිරීමේ අරමුණෙන් ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමාගේ මඟ පෙන්වීම මත පොලිස්පතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ රුපියල් මිලියන 11 කට අධික මුදලක් වැයකර නව අධිබලැති උඳුනක් ශ්‍රී ලංකා පොලිසියේ වියදමින් මිලදී ගෙන මෙසේ ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී. මෙම උඳුන ස්ථානගත කිරීම සඳහා ස්ථානය සකස් කිරීමේ කටයුතු ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් භාරගත් අතර, ඒ සඳහා රුපියල් මිලියන 6.34 ක මුදලක් ශ්‍රී ලංකා පොලිසිය විසින් වැයකර ඇත.

මෙසේ ඉදිකරන ලද අධිබලැති උඳුනේ ප්‍රථම වරට මත්ද්‍රව්‍ය තොගයක් විනාශ කිරීම 2024.05.18 වන දින සවස 05.00ට ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ හා පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සහභාගිත්වයෙන් සිදු කිරීමට නියමිතව ඇත.

විශේෂ මෙහෙයුම් මගින් මෙන්ම නිලධරයන් වෙත ලද තොරතුරු මත මෙරට විවිධ ප්‍රදේශවලින් අත්අඩංගුවට ගන්නා ලද මත්ද්‍රව්‍ය විනාශ නොකරන බවට විවිධ අවස්ථාන්වල දී මහජනතාව විසින් පොලිසිය වෙත චෝදනා එල්ල කළ නමුත්, මීට පෙර අවස්ථා කිහිපයකදී නඩු කටයුතු අවසන් වූ මත්ද්‍රව්‍ය තොග කිහිපයක් පුත්තලම **INSEE** සිමෙන්ති කර්මාන්ත ශාලාවේ උඳුන භාවිතා කරමින් පූර්ණ විනිවිද භාවයෙන් යුතුව විනාශයට ලක් කරන ලදි.

මත්ද්‍රව්‍ය විනාශ කිරීම සඳහා මීට පෙර පැවති නීති ප්‍රතිපාදන අනුව නඩු කටයුතු අවසන් වූ පසු මත් ද්‍රව්‍ය විනාශ කිරීමට හැකියාව තිබූ නමුත් 2022 අංක 41 දරණ විෂ අබිං හා අන්තරාදායක ඖෂධ සංශෝධන පනතේ අඩංගු ප්‍රතිපාදන ප්‍රකාරව නඩු කටයුතු අවසන් වීමට පෙර නඩු කටයුතු වලට අදාල මත්ද්‍රව්‍ය විනාශ කිරීමට අවස්ථාව සැලසේ.

ඒ අනුව මෑතකදී නඩු කටයුතු අවසන් වූ පාකිස්තානු ජාතිකයන් 07 දෙනෙකු සන්තකයේ තිබී අත්අඩංගුවට පත් වූ හෙරොයින් කිලෝ 279 ග්‍රෑම් 591 ක් හා මෙතැම්පිටමින් හෙවත් අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 45 ග්‍රෑම් 654ක ප්‍රමාණයක් 2024.05.18 වන දින පුත්තලම, වනාතවිල්ලුව, ප්‍රදේශයේදී විනාශ කිරීමට නියමිතය.

මෙම මත්ද්‍රව්‍ය තොගය සෙල්ශියස් අංශක 800 – 1200 අතර දක්වා උෂ්ණත්වයකින් විනාශ කිරීම සිදු කල යුතු අතර, ඒ සඳහා පැය 08 ක කාලයක් ගතවේ. මෙම උඳුන පැයක කාලයක් ක්‍රියාත්මක කිරීම සඳහා ගෑස් කිලෝ ග්‍රෑම් 15ක් සහ ඩීසල් ලීටර් 04ක ප්‍රමාණයක්ද වැය වේ.

මත්ද්‍රව්‍ය තොගය විනාශ කිරීම පූර්ණ විනිවිද බාවයකින් යුතුව සිදු කිරීමට කටයුතු කරන අතර ඒ සඳහා ගරු අධිකරණ විනිසුරුවරු, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නියෝජිතයින්, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන්, මාධ්‍යවේදීන් හා මත්ද්‍රව්‍ය නිවාරණ කාර්යංශ නිලධාරින් ඇතුළු සියළු ජනමාධ්‍ය නියෝජනය කරමින් මාධ්‍යවේදී මහත්ම, මහත්මීන්ද මේ සඳහා සම්බන්ධ වේ.

මේ තුළින් මහජනතාව විසින් නිරතුරු ප්‍රශ්න කරනු ලබන අත්අඩංගුවට ගන්නා ලද විෂ මත්ද්‍රව්‍ය වලට කුමක් වන්නේද යන්න පූර්ණ විනිනිද භාවයකින් යුතුව ඉදිරියේදී පිළිතුරු ලබා දීමට හැකියාව උදාවනු ඇත.

ඡායාරූපය



මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.